# තඹුත්තේගම කුඩාගම වෙසෙන අහිකුණ්ඨික ජනයාගේ ඇදහිලි හා විශ්වාස

**ආර්. කේ. ඩී. රන්දෙනි[1] හා ඒ. මංගලිකා දිසානායක[2]**

[1]ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ - rkdrandeni@yahoo.com

[2]ගුරු උපදේශක, වෘත්තිය මාර්ගෝපදේශ හා උපදේශන අංශය, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, උතුරුමැද පළාත - අනුරාධපුරmangaleedisa@gmail.com

## හැඳින්වීම

ලංකාවාසී අහිකුණ්ඨික ජනයා ඉන්දියාවේ ආන්ද්‍රා ප්‍රදේශයේ සිට සංක්‍රමණය වූ ජන කොටසක් ලෙස විශ්වාස කෙරේ. ඔවුහු විවිධ ගෝත්‍ර ප්‍රභේද, චාරිත්‍ර හා චර්යා රටාවන් පවත්වා ගනිමින් ලංකාවේ විවිධ පළාත් වල වෙසෙති. ඒ අතර වව්නියාව, මිහින්තලය, තඹුත්තේගම, කලාවැව, ගල්ගමුව. මඩකලපුව ආදි ප්‍රදේශ වැදගත්ය.

අහිකුණ්ඨික යන පදයෙහි නිශ්චිත අරුතක් සෙවීම උගහටය. පැරණි සංස්කෘති හා පාළි සාහිත්‍යයයන්හි අහිගුණ්ඨික අහිකුණ්ඨික යනාදි වශයෙන් යෙදී තිබේ. කෙසේ වෙතත් අහිකුණ්ඨික යන්න "උගුල් ඇටවීම" "වෙලිම" යන අදහස ඇති සංස්කෘතික ගුණ්ඨ ධාතුවකයැයි අනුමාන කෙරේ.

තඹුත්තේගම වෙසෙන අහිකුණ්ඨික ජනයාද මුල් කාලයේදි ප්‍රදේශයෙන් ප්‍රදේශයට කණ්ඩායම් ලෙස ඇවිදිමින් තාවකාලික වාඩි (නාඉල්ල හෙවත් ඉල්ලම) කුප්පායම් අටවා ගනිමින් තම ජිවිකාවෘත්තීන් වල යෙදෙයි. එනම් නයි නැටවීම, රිලවුන් නැටවීම, අත බලා ශාස්ත්‍ර කිම වැනි කාර්යයන් හි නිරත වූහ.

මෙලෙස ප්‍රදේශයෙන් ප්‍රදේශයට කණ්ඩායම් ලෙස ඇවිදිමින් ජිවිකාව ගත කළ ඔවුන් 1980 ගණන් වල මුල් භාගයේදි ස්ථාවර පදිංචියට රජය විසින් යොමු කර ඇත. එහෙත් ඔවුන්ගේ පරණ පුරුදු ජිවන වෘත්තීන් කිරීම සඳහා නියම කර ගත් දිනයන් හා ප්‍රදේශවල සංචාරය කිරිම පුරුදු පරිදි කරති. මේ බව අධ්‍යයනයෙන් තහවුරු විය.

ලංකාවේ අහිකුණ්ඨික ජනයා පිළිබඳව විවිධ විද්වතුන් විසින් මානව විද්‍යාත්මක හා සමාජ විද්‍යාත්මක පර්යේෂණයන්හි නිරතව ඇත. ශීඝ්‍රයෙන් පරිවර්තනයට ලක්වන වර්තමාන සංකීර්ණ සමාජ ක්‍රමය තුළ ඔවුන්ගේ ජිවන චර්යාවන් ඇඳුම, පැළඳුම ආදියෙහි වෙනස ඉතා ඉක්මනින් සිදු වුවද ඔවුන්ගේ ඇදහිලි හා විශ්වාසයන් ආදියෙහි වෙනස්කම් සිදුවිම සිදු වී ඇත්තේ ඉතා සෙමිනි.

මේ බව අනුරාධපුර දිස්ත්‍රික්කයේ මහවැලි H කලාපයට අයත් තඹුත්තේගම කුඩාගම ඇසුරින් කළ අධ්‍යයනයේ තහවුරු විය. මේ ගම ස්ථාවර පදිංචියට හුරු කළ අහිකුණ්ඨික හා සිංහල ජන සමාජයක් වෙසෙන ගමකි. කුඩාගම වෙසෙන අහිකුණ්ඨික ජනයා පිළිබඳ පර්යේෂකයන්, විද්වතුන් පර්යේෂණයන් කර ඇතිමුත්. ඔවුන්ගේ "ඇදිහිලි හා විශ්වාස" පිළිබඳ කළ අධ්‍යයනය ඉතා වටිනා කාර්යක් ලෙස සැලකිය හැකිය.

## පර්යේෂණයේ අරමුණු

1. තඹුත්තේගම වෙසෙන අහිකුණ්ඨික ජනයාගේ සමාජ ආර්ථික තොරතුරු දැනගැනිම.
2. එකී අහිකුණ්ඨික ජනයාගේ ඇදහිලි හා විශ්වාස පිළිබඳ අධ්‍යයනයක් කිරිම.

## පර්යේෂණ ක්‍රමවේදය

1. ප්‍රාථමික දත්ත ලබා ගැනීම.

2. ද්විතියික දත්ත ලබා ගැනීම.

3. සහාභාගිත්වය නිරීක්ෂණය - හිම බෝල නියැදුම් ක්‍රමය Snow bolt sampling method

4. සම්මුඛ සාකච්ඡා

**පර්යේෂණ තොරතුරු**

**සමාජ තොරතුරු**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ අංක 14 තඹුත්තේගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ H බල ප්‍රදේශය තුළ අංක 419 ඉකිරි වැව ග්‍රාම නිලධාරි කුලානේ "කුඩාගම" පිහිටා ඇත. දළ වශයෙන් ගොඩ ඉඩම් අක්කර 170ක් හා මඩ ඉඩම් හෙක්ටාර 30 පමණ මෙම භූමි භාගයට අයත්ය. අනුරාධපුර කුරුණෑගල ප්‍රධාන මාර්ගයේ සිට සැ. 02 ක් පමණ ගිය විට කුඩාගමේ අහිකුණ්ඨික නිවාස දකිය හැකිය. ගමේ මුල් කොටස සිංහල බෞද්ධ පවුල් ගණනාවක් ජීවත් වේ. ජන කොටස් දෙකටම පොදු පාසලක්, පන්සලක ගම තුල පිහිටා තිබේ.

1981 කැකිරාව කුඩා කුඹුක්වැව ප්‍රදේශයේ ඒකරාශිව සංචාරක ජීවිතයක් ගත කළ අහිකුණ්ඨික පවුල් 27ක් වූ අතර මේ වන විට පවුල් 399 දක්වා ව්‍යාප්ත වි ඇත. මුළු ජනගහනය (ස්ත්‍රීන් 803, පුරුෂ 783) 1586ක් අහිකුණ්ඨක ජනයා වෙසේ.

මේ වන විට මහා සමාජයට අනුකූලව ඔවුන්ගේ සමාජ ක්‍රමය පරිවර්තනයකට පත්වී ඇත. ඔවුන්ගේ නම් වාසගම් නූතන පරම්පරාවේ දරුවන්ගේ වෙනස් කම් කර ඇත. උදා: සිරිමලි, මංගල, ටිකිරි බංඩා, විජේරත්න, මාටින් වයසින් වැඩිහිටියන්ගේ නම් වෙනසක් කර නැත. උදා: වනරක්කා, සුටිකිරා, මසන්නා, R අනවතු MS සින්නමුත්තු සාමි, W අගුරැත්නා වැඩිහිටි පරම්පරාව තම වයස, උපන් දිනය කිසිවක් නොදනි. වර්තමාන පරම්පරාව රෝහල් වල උපත ලැබීම නිසා උප්පැන්න සහතිකයක් ඔවුනට හිමිව ඇත.

ඔවුන්ගේ පාසල් යන වයසේ පසුවන දරුවන්ට අධ්‍යාපනය ලබාදිම සඳහා උනන්දුවක් ඇති කර අ/කුඩාගම විද්‍යාලයට ඇතුළත් කොට ඉගෙනුම ලබයි. පන්සලේ දහම් පාසලේද දරුවන් ඉගෙනුම ලබයි. කුඩාගම විද්‍යාලයේ වූ ශිෂ්‍ය සංඛ්‍යාව (2013) 261ක් වන අතර මෙයින් 216ක් මොවුන්ගේ දරුවන් වන අතර පෙර පරිදිම මෙයින් 45ක් සිංහල දරුවන් වේ.

අහිකුණ්ඨක ගමටද ගෝත්‍රික නායකයෙක් සිටි. නමින් ඔහු කේ ඒපී නඩරාජා නම් වේ. ඔහුගේ නායකත්වයෙන් ගමේ සියලුම පවුල් වල කටයුතු සම්බන්ධව තීන්දු තිරණ ගැනිම්, වරදකරුවන්ට දඩුවම් දීම ආදිය සිදු කෙරේ. ලේකම් සභාපති සහිතව ගෝත්‍රික සභාවක් පවති. නායකයාගේ පුතා සභාපති වශයෙන් කටයුතු කරයි. එය දූන් හඳුන්වනුයේ මරණාධාර සමිතිය වශයෙනි.

මෙහිදි ගමේ පවුල් වල සංවර්ධනය සඳහා කෙරෙන කාර්යයන්, පවුල් ආරවුල්, නඩු හබ යනාදිය විසඳිම හා වැරදිවලට දඩුවම් ලබා දිම සිදු වේ. බොහෝ විට දඩුවම් ලෙස දෙනු ලබන්නේ දඩ ගැසිම (මුදල් දඩ) සභාවෙන් සකස් කළ නොහැකි වැරදි රටේ සාමාන්‍ය නීතියට යොමු කරයි. එමෙන්ම ගමෙන් පිට පළාත් වල සම්ප්‍රදයික රැකියා කිරීමට යන දිනයන් හා ප්‍රදේශ තීරණය කරනු ලබන්නේ ද මේ සභාව මගිනි.

වගුව. 1. වයස් මට්ටම අනුව ජන සංයුතිය

| වයස් මට්ටම | ස්ත්‍රී | පුරුෂ |
|---|---|---|
| 0 - 4 | 106 | 103 |
| 5 - 13 | 176 | 171 |
| 14 - 18 | 104 | 103 |
| 19 - 60 | 346 | 340 |
| 60 වැඩි | 71 | 66 |

*(2011 ජන හා නිවාස සංගණන වාර්තා අනුව)*

ලංකාවේ කුමන ප්‍රදේශයක සිටියද මේ සභාවට, රැස්වීමට සහභාගි විය යුතුය. නැතහොත් දඩ ගැසීම සිදු කරයි.

### ආර්ථික තොරතුරු

කුඩාගම පදිංචි වූ මුල් පවුල් 27 සඳහා ගොඩ ඉඩම් අක්කර 1/2ක් හා කුඹුරු අක්කර 2 1/2ක් මොවුනට ලබා දී ඇත. ඒ අනුව වී ගොවිතැන, බඩ ඉරිගු හා එළවළු වැනි ගොඩ බෝග වගාවන්ද මොවුහු කරති. එළුවන් කුකුළන් ඇති කරයි. එමෙන්ම ඔවුන්ගේ සම්ප්‍රදායික ආර්ථික කටයුතු කිසිසේත්ම නවතා නැත. පිරිමි නයි නැටවීම, රිලවුන් නැටවීම කාන්තාවන් ශාස්ත්‍ර කීම වැනි කටයුතු වල නිරත වේ. ඊට අමතරව කුඩා පොත් පත් (මුද්‍රණ හා ලියන) පින්තූර නගර වල ආයතන වලට හා බස්රථ වල අලෙවි කිරීම සඳහා පෙළඹී ඇත. ඊට අමතරව ලොරි රථ, ත්‍රී රෝද රථ මගින් ප්‍රවාහන සේවය ලබා දෙමින් මුදල් ඉපයීම කරන්නෝද මේ අතර වෙති. තාක්ෂණ විද්‍යාල මගින් වඩු කාර්මික පාඨමාලා හදාරා වඩු කාර්මික ශිල්පයේද වෘත්තීන් ලෙස කරන්නෝ ඇත. ටිකිරි බංඩා, විජේරත්න එවැන්නෙකි. බිලිබෑමෙන් මාළු ඇල්ලීමද ඔවුන් අතර ජනප්‍රියය.

යුද හමුද සේවයේ, ඇඟළුම් කර්මාන්ත ශාලා වල සේවයේ යෙදීම, දෛනික කුළි වැඩ කිරීම වැනි ආර්ථික කටයුතු වලද ඔවුන් නියැලී ඇත. විදේශගත ගෘහ සේවයේ යෙදුන කාන්තාවන් කිහිපදෙනෙක්ද ඒ අතර විය. සාම්ප්‍රදයික රැකියා කිරීමට යන විට ඔවුන් ඔවුනගේ සාම්ප්‍රදයික ඇඳුම් හා ආභරණ ආයිත්තම් වලින් සැරසෙයි. සාමාන්‍යයෙන් වෙනත් ගමන් බිමන් යන විට වෙනස් වූ සාමාන්‍යය සමාජයේ කාන්තා හා පිරිමි ඇඳුමින් සැරසීම දක්නට ලැබේ.

නිවාස ගත් විට බෙහෝ විට සාමාන්‍යය මට්මමේ පවතී. ගඩොලින් බැඳි ගෙවල් හා සීට් හෙවිල්ලූ ගෙවල් වැඩි අතර, සාමාන්‍ය මට්ටමේ මැටියෙන් සෑදූ ගෙවල් සුළුතරයක් ඇත. එක ම පවුලේ දූ දරුවන් එකම ඉඩමේ කුඩා කුඩා ගෙවල් සාදගෙන ඇත. කතාකරන බස දෙමළ මිශ්‍රිත තෙළිගු භාෂාව වන අතර සියලුම දෙනා තෙළිගු භාෂාව කතා කරයි. දරුවන් ද ඉගෙන ගන්නේ සිංහල භාෂාවෙනි.

### ඇදහිලි හා විශ්වාස.

වර්තමානය වන විට මේ ජනගහනයෙන් බහුතරයක් ක්‍රිස්තියානි ආගම අදහන අතර තවත් පවුල් කිහිපයක් බුද්ධාගම අදහමින් ගමේ පන්සලේ සිල් සමාදන් වෙමින් පන්සලට දනය දිම බණ භාවනා කිරිම් වල යෙදෙයි. ඔවුන් සතුන් ඇති කිරිම රිලවුන් නයින් නැටවීම පවක් සිදූ වන දෙයක් ලෙස දකි. සෑම ඉරිදවකම ගල්ගමුව ක්‍රිස්තියානි පල්ලියට ගොස් යාඥා කිරිම අනෙක් පවුල් වල සාමාන්‍ය සිරිතයි. වර්තමාන තත්වය මෙසේ වූවද ඔවුන් තම සම්ප්‍රදයික දේ වලින් මිදී නැත.

ඔවුන් සම්ප්‍රදායික ආගම් අතර වැදගත් තැනක් දෙනුයේ "පච්ච ආගම" යනුවෙන් හැඳින්වෙන ආගමටය. ගමේ පවුල් 40ක් මේ ආගම අදහයි. එහිදී ඇන්ගටෙන්නා, කන්‍යාම්මා යනුවෙන් හැඳින්වෙන දේවිය හා දේව මෑණි කෙනෙක් අදහයි. ඒ පිළිම සුරැකිව පෙට්ටියක තබා ගෙන සිටී. එය " දවරිකි පෙට්ටි" නමින් හැඳින්වේ. අවුරුද්දකට වතාවක ඇන්ගටෙන්නා, කන්‍යාම්මා දෙදෙනා වෙනුවෙන් වැව් පිටියක පූද පූජා පවත්වා යාතිකා කරයි. බිලි පූජා දිමද මෙහිදී සිදුවේ. තව ද කාලි මෑණියන් ඇදහිම, මළවුන් ඇදහිම, පත්තිනි මෑණියන් ඇදහිම, වෘක්ෂ වන්දනාව වැනි ඇදහිලි රාශියක් ඔවුන් කරනු ලබයි එමෙන් ම මීතෙල් මතුරා ගෑමෙන් දරුවන්ට ආශිර්වාද විධික්‍රමයක් ඔවුන් ළග ඇති බව නායක නඩරාජා විසින් අධයයනයේදි හෙළි කලේය.

තවද ඇස් වහ කට වහ පිච්චිම වැනිදේද ඔවුහු තවමත් කරති. මල්වර කිල්ල හා මරණ කිල්ල පිළිබදව දැඩි සේ ඔවුන් විශ්වාස කරයි. මල්වර වූ දූරියක දවස් 07ක් වෙන් කොට තබා නහවා නැවත අනෙක් අය සමග එකතු කර ගනි. මරණයක් වූ පසුවද එසේ විවිධ චාරිත්‍ර වාරිත්‍ර ඔවුහු තාමත් අනුගමනය කරති.

විවාහ සිදූ කරනුයේ නෑනා මස්සිනා විවාහයයි. එය උඩු පිළ හා යටි පිළ වශයෙන් හඳුන්වයි. ඊට අමතරව සහෝදර විවාහය සිදූ වූ විට දඩුවම්දීම හා දඩ ගැසිම් කරනු ලබයි. අහිගුණ්ඨික පිරිමින් සමග සිංහල කාන්තාවන්ද විවාහ වූ අවස්ථා ද දක්නට ඇත.

තවද නයි විෂ නැති කිරිම සඳහා ඔවුන් විසින් සකසා ගන්නා "විෂ ගල" ඉතා

සුවිශේෂී වෛද්‍ය ක්‍රමයකි. ඒ සාදනු ලබන්නේ ස්වභාවික ද්‍රව්‍ය කිහිපයක එකතුවෙනි.

යන්ත්‍ර මන්ත්‍ර වශී කර්ම ඔවුන් අතර ප්‍රබලය.

සුභාසුභ නිමිතිද ඔවුන් විශ්වස කරනු දක්නට ලැබිණි. ගමනක් යන විට ඉස්සරහට ගැරඩියෙක් පැමිණ උං වමට ගියොත් අසුභයි. දකුණට ගියොත් සුභයි. හාවෙක් ඉදිරියට හමු වී වමට පැන්නොත් දරුණු හානි වේ. හාවා දකුණට පැන්නොත් සුභයි.

මේ ආදි වශයෙන් ඇදහිලි හා විශ්වාස රාශියක් ඔවුන් තවමත් භාවිතයට ගනි.

**නිගමනය**

තෙළිගු බස කථා කරන කුඩාගම වෙසෙන අහිකුණ්ඨික ජනයා ස්ථාවර පදිංචියට ගියද ඔවුන්ගේ ගෝත්‍රික බස ඇදහිලි විශ්වාස සාම්ප්‍රදයික උපකරණ ඇඳුම් පැළඳුම් පුද පූජා සිරිත් විරිත් හා චර්යා ලක්‍ෂණ වලින් නවිකරණය විම ඉතා සෙමිනි.

භෞතිකව ඔවුන් තුළ වෙනස්කම් දක්නට ලැබුණ ද සිංහල සමාජ ප්‍රවාහ තුළට අන්තර් ග්‍රහණය විමේදි ඔවුන්ගේ ගෝත්‍රික අනන්‍යතාවයට ඇත්තේ මහත් ගෞරවයකි.

වැඩිහිටි සමාජය ඔවුන් කතා කරන තෙළිගු බස අද දරුවන්ගෙන් වෙනස් වි යාම පිළිබඳව ඔවුනට ඇත්තේ කණගාටුවකි. නූතන සමාජයේ තම තරුණ දරුවන්ගේන් සාම්ප්‍රදයික සිරිත් විරිත් හා රැකියාවට විරෝධය ඇති වේ. උද :කාන්තාවන් පිරිමින් එකට අරක්කු බිම හා නැටීම.

එමෙන්ම ගෝත්‍රික අලසකම නිසා බොහෝ විට යැපුම් මානසික තත්වයෙන් මිදි නොත්බිම දක්නට ලැබේ.

**ප්‍රධාන වචන**

අහිගුණ්ඨික, අහිකුණ්ඩික, නායිල, ඉල්ල්, කුප්පායම, ආරච්ච, කිල්ල, දවරිකි පෙට්ටි

**ආශ්‍රෙය ග්‍රන්ථ**


රත්නපාල, නන්දසේන ජනශ්‍රැති විද්‍යාව 2007 - ඇස් ගොඩගේ සහ සහෝදරයෝ. කොළඹ 10

මහේන්ද්‍ර සුනන්ද පුරාණෝක්ති සංග්‍රහය 2003 - ඇස් ගොඩගේ සහ සහෝදරයෝ. කොළඹ 10

රණසිංහ චන්ද්‍ර ශ්‍රී ලොව පැතිර වසන අහිකුණ්ඨකයෝ 2003 - චතුර ප්‍රින්ටින් වර්ක්ස් වැල්ලම්පිටිය

රණසිංහ චන්ද්‍ර ශ්‍රී එංගලන්ත වාසි අහිකුණ්ඨක ජනකථා 2003 - චතුර ප්‍රින්ටින් වර්ක්ස් වැල්ලම්පිටිය

Dvendra Tissa, The Gypsy Who Staged - WW. Virtnal Library Sri Lanka

Ragahavan MD, Ethoogy Curvey of Ceylon No. 04 The Ahikuntakaya, The Ceylon Gipsy/ Tribe